# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2263/37 - 2022 ජනවාරි මස 21 වැනි සිකුරාදා - 2022.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරුමැද පළාත් සභාව

උතුරු මැද පළාතේ ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික) විධිවිධාන පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය යටතේ කරනු ලබන නියමයයි.

**මහීපාල හේරත්,**
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

2022 ජනවාරි මස 21 වැනි දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය,
පළාත් සභා සංකීර්ණය, ධර්මපාල මාවත,
අනුරාධපුර.

**නියමය**

උතුරු මැද පළාතට අයත්, මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් 2022 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 17 වැනි වගන්තිය මගින් සංශෝධිත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 169 වන වගන්තිය ප්‍රකාරව සකස් කොට සභාවට ඉදිරිපත් කරනු ලැබ, එය සම්මත කරනු නොලැබීම හේතුවෙන් සහ එකී 169 වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2021.12.31 වැනි දින සිට සභාපතිවරයා වන හේරත් හාමිගේ සේනාරත්න යන අය ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වූවා සේ සලකනු ලැබිය යුතු අතර, ඒ දින සිට බලපැවැත්වෙන පරිදි අදාළ සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වූවාසේ සැලකිය යුතුය.

EOG 01 - 0224/1

## උතුරුමැද පළාත

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, උතුරු මැද පළාතේ ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මම පහත සඳහන් නියමයන් දැනුම් දෙමි.

**මහීපාල හේරත්,**
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

2022 ජනවාරි මස 21 වැනි දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය,
පළාත් සභා සංකීර්ණය, ධර්මපාල මාවත,
අනුරාධපුර.

**නියමය**

උතුරු මැද පළාතට අයත්, අනුරාධපුර දිස්ත්‍රික් සීමාව තුළ පිහිටි මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයට අදාළ අයවැය ලේඛනය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 17 වැනි වගන්තිය මගින් සංශෝධිත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 169 යන වගන්තිවල විධිවිධාන පරිදි සම්මත කිරීමට අපොහොසත්වීම හේතුවෙන් මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ධුරය එකී 169 වගන්තිය අනුව පුරප්පාඩු වන බැවින්, 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ (සංශෝධන) පනතට අනුව එම පුරප්පාඩුව පිරවෙන තෙක් සභාපතිවරයාගේ ධුරය පුරප්පාඩු වූ දින සිට එම තනතුරේ බලතල, කටයුතු කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 8(4) වැනි වගන්තිය ප්‍රකාරව උප සභාපතිවරයා වෙත පැවරෙන බව මෙයින් දැනුම් දෙමි.

තව ද, පත්ව එනු ලබන නව සභාපතිවරයා විසින් 2022 මුදල් වර්ෂය සඳහා වන අයවැය ලේඛනය සභාව වෙත ඉදිරිපත් කොට යථා පරිදි සම්මත කරගන්නා තෙක් කාලසීමාවක් දක්වා මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම තහවුරු කිරීම පිණිස මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් සකස් කර අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයට අදාළ පුනරාවර්තන වියදම් සහ මේ වන විට ක්‍රියාත්මකව පවතින විශේෂ ව්‍යාපෘතිවලට අදාළ අත්‍යාවශ්‍ය වියදම් දැරීම සඳහා මා විසින් මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයාට මෙයින් නියම කරමි.

EOG 01 - 0224/2

---

## උතුරුමැද පළාත් සභාව

උතුරු මැද පළාතේ ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය යටතේ කරනු ලබන නියමයයි.

**මහීපාල හේරත්,**
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

2022 ජනවාරි මස 21 වැනි දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය,
පළාත් සභා සංකීර්ණය, ධර්මපාල මාවත,
අනුරාධපුර.

**නියමය**

උතුරු මැද පළාතට අයත්, දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් 2022 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 17 වැනි වගන්තිය මගින් සංශෝධිත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 169 වන වගන්තිය ප්‍රකාරව සකස් කොට සභාවට ඉදිරිපත් කරනු ලැබ, එය සම්මත කරනු නොලැබීම හේතුවෙන් සහ එකී 169 වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් 2021.12.31 වැනි දින සිට

සභාපතිවරයා වන ජයන්ත මාරසිංහ යන අය ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වූවා සේ සලකනු ලැබිය යුතු අතර, ඒ දින සිට බලපැවැත්වෙන පරිදි අදාළ සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වූවාසේ සැලකිය යුතුය.

EOG 01 - 0224/3

## උතුරුමැද පළාත

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව, උතුරු මැද පළාතේ ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මම පහත සඳහන් නියමයන් දනුම් දෙමි.

**මහීපාල හේරත්,**
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

2022 ජනවාරි මස 21 වැනි දින,
උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය,
පළාත් සභා සංකීර්ණය, ධර්මපාල මාවත,
අනුරාධපුර.

### නියමය

උතුරු මැද පළාතට අයත්, පොළොන්නරුව දිස්ත්‍රික් සීමාව තුළ පිහිටි දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයට අදාළ අයවැය ලේඛනය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 හා 2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ 17 වැනි වගන්තිය මගින් සංශෝධිත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 169 යන වගන්තිවල විධිවිධාන පරිදි සම්මත කිරීමට අපොහොසත්වීම හේතුවෙන් දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ධුරය එකී 169 වගන්තිය අනුව පුරප්පාඩු වන බැවින්, 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ (සංශෝධන) පනතට අනුව එම පුරප්පාඩුව පිරවෙන තෙක් සභාපතිවරයාගේ ධුරය පුරප්පාඩු වූ දින සිට එම තනතුරේ බලතල, කටයුතු කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 8(4) වැනි වගන්තිය ප්‍රකාරව උප සභාපතිවරයා වෙත පැවරෙන බව මෙයින් දනුම් දෙමි.

තව ද, පත්ව එනු ලබන නව සභාපතිවරයා විසින් 2022 මුදල් වර්ෂය සඳහා වන අයවැය ලේඛනය සභාව වෙත ඉදිරිපත් කොට යථා පරිදි සම්මත කරගන්නා තෙක් කාලසීමාවක් දක්වා දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම තහවුරු කිරීම පිණිස දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් සකස් කර පොළොන්නරුව පරිපාලන දිස්ත්‍රිකයේ සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයට අදාළ පුනරාවර්තන වියදම් සහ මේ වන විට ක්‍රියාත්මකව පවතින විශේෂ ව්‍යාපෘතිවලට අදාළ අත්‍යාවශ්‍ය වියදම් දැරීම සඳහා මා විසින් දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ උපසභාපතිවරයාට මෙයින් නියම කරමි.

EOG 01 - 0224/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.